අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112784846
isurupaya@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/03/56/04/01
ඔබේ යොමුව / உமது இல. / Your Ref.
දිනය / திகதி / Date 2023.12 .21

චක්‍රලේඛ අංක : **38/2023**

පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සහ
සියලු ම පාසල් විදුහල්පතිවරුන් වෙත.

**<u>පාසල් පර්යේෂණ ශිෂ්‍ය සමාජ ස්ථාපිත කිරීම</u>**

## 1.0 හැඳින්වීම

නව දැනුම ගවේෂණය සඳහා භාවිත කරන බුද්ධිමත් හා තර්කානුකූල ක්‍රියාවලියක් ලෙස පර්යේෂණ හැඳින්විය හැකි ය. මෙය වෛද්‍ය, ඉංජිනේරු, සමාජ විද්‍යා සහ අධ්‍යාපන වැනි විවිධ විෂය ක්ෂේත්‍ර ඔස්සේ බොහෝ විට ක්‍රියාත්මක වේ. නිශ්චිත ගැටලුවලට පිළිතුරු ලබා ගැනීම, ගැටලු විසඳීම, නව දැනුම ගවේෂණය සඳහා තොරතුරු හා දත්ත එකතු කිරීම, විශ්ලේෂණය කිරීම සහ අර්ථ නිරූපණය කිරීම ඇතුළත් ක්‍රමානුකූල සහ සංවිධානාත්මක විමර්ශන ක්‍රියාවලියක් වන පර්යේෂණ මඟින් නැවත නැවත ගවේෂණය කිරීමක් ද සිදු වේ. නව දැනුම නිර්මාණය කිරීම, වැරදි සංකල්ප නිවැරදි කරමින් පවතින දැනුම ක්‍රමානුකූල ව සකස් කිරීම මෙන් ම පවතින දැනුම හා තොරතුරු භාවිතයෙන් නිවැරදි තීරණ ගැනීමට හැකියාව ලැබීම ආදිය විශ්ව ගම්මානයට පිවිසීමේ දී අත්‍යවශ්‍ය සාධක බවට පත් ව තිබේ. ඒ සඳහා රටක අනාගත පුරවැසියන් වන පාසල් සිසුන් නව දැනුමින් සන්නද්ධ කර ගවේෂණාත්මක ව හා තර්කානුකූල ව අනාගත වැඩ ලෝකයට සූදානම් කිරීම සඳහා පර්යේෂණ වෙත යොමු කිරීම සිදු කළ යුතු අතර නව පර්යේෂණ තුළින් බිහි වන දැනුමට ගෝලීය වශයෙන් වටිනාකමක් ජනිත කරවීම ද අවශ්‍ය වේ.

මෙරට පාසල් පද්ධතිය තුළ සාක්ෂ්‍ය පදනම් කරගත් තීරණ ගැනීමේ සංස්කෘතියක් නිර්මාණය කිරීම තුළින් දැනුමින් පිරි අනාගතයකට දැයේ සිසු - සිසුවියන් යොමු කිරීමේ අරමුණ ඇතිව පාසල් පර්යේෂණ ශිෂ්‍ය සමාජ ආරම්භ කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් කටයුතු සැලසුම් කර ඇත. ඒ සඳහා අදාළ කොන්දේසි, උපදෙස් හා මාර්ගෝපදේශ මෙම චක්‍රලේඛය මඟින් නිකුත් කෙරේ. 2024. 01. 01 දින සිට බල පැවැත්වෙන මෙම චක්‍රලේඛ උපදෙස් ප්‍රකාර ව පාසල් පර්යේෂණ ශිෂ්‍ය සමාජ ස්ථාපිත කිරීමට හා වාර්ෂික ව එම සමාජ බලගැන්වීමට කටයුතු කරන ලෙස ඔබ පළාතේ / අධ්‍යාපන කලාපයේ / අධ්‍යාපන කොට්ඨාසයේ / විදුහලේ ගුරුවරුන් හා සිසුන් දැනුම්වත් කළ යුතු ය.

## 2.0 පාසල් පර්යේෂණ ශිෂ්‍ය සමාජ හැඳින්වීම

පාසල් පර්යේෂණ ශිෂ්‍ය සමාජ යනු පාසල් සිසුන් පර්යේෂණ ආශ්‍රිත ක්‍රියාකාරකම්වල යෙදීම දිරිමත් කිරීම සහ පර්යේෂණ සිදු කිරීමට යොමු කරවීම සඳහා පාසල්වල පිහිටුවන විෂය සමගාමී ක්‍රියාකාරකම්වලින් සමන්විත ශිෂ්‍ය සමාජයකි.

**3.0 පාසල් පර්යේෂණ ශිෂ්‍ය සමාජ ආරම්භ කිරීමේ අවශ්‍යතාව**

පාසල් තුළ පර්යේෂණ සංස්කෘතියක් නිර්මාණය කිරීම සහ පාසල් සිසුන්; අධ්‍යාපනික, විචාරාත්මක, ගවේෂණාත්මක හා නිර්මාණාත්මක පර්යේෂණ ව්‍යාපෘතිවල නියැලීම දිරිමත් කිරීම, ඒ සඳහා පහසුකම් සම්පාදනය හා නිසි මඟ පෙන්වීම පාසල් පර්යේෂණ ශිෂ්‍ය සමාජ ස්ථාපිත කිරීමෙන් අපේක්ෂා කෙරේ. පාසල් පර්යේෂණ ශිෂ්‍ය සමාජ ස්ථාපිත කිරීමට අදාළ ව පහත මාර්ගෝපදේශ අනුගමනය කළ යුතු ය.

**4.0 පාසල් පර්යේෂණ ශිෂ්‍ය සමාජ පිහිටුවීමේ අරමුණු**

4.1 ගවේෂණය, තොරතුරු රැස් කිරීම, විශ්ලේෂණය හා ඉදිරිපත් කිරීම මඟින් සිසුන්ගේ විචක්ෂණශීලී චින්තනය වැඩි දියුණු කිරීම.

4.2 විවිධ විෂය ගවේෂණයට සිසුන් උනන්දු කරවීම මඟින් පාසල් පර්යේෂණ සංස්කෘතියක් ස්ථාපිත කිරීම.

4.3 විචාරාත්මක චින්තනය සහ ගැටලු විසඳීමේ කුසලතා වර්ධනය කිරීම මඟින් පාසලේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ශක්තිමත් කිරීම.

4.4 පර්යේෂණ ක්‍රියාකාරකම්වල නිරත වීම තුළින් ස්වයං අධීක්ෂණය, ඉලක්ක ළඟා කර ගැනීම උදෙසා කටයුතු කිරීම, නිසි කාල කළමනාකරණය ආදිය මඟින් පෞරුෂ වර්ධනය කිරීම.

4.5 පර්යේෂණ කුසලතා වර්ධනය කර ගැනීමට අවස්ථා සම්පාදනය කිරීම තුළින් සිසුන් ලබා ගන්නා අත්දැකීම් හා පළපුරුද්ද මඟින් ඔවුන්ගේ උසස් අධ්‍යාපන අවස්ථා සඳහා ප්‍රවේශය පහසු කිරීම.

4.6 පාසල් ප්‍රජාවේ අවශ්‍යතා හා ගැටලු හඳුනාගෙන පර්යේෂණාත්මක ව නිසි විසඳුම් ගවේෂණය සඳහා සිසුන් පෙළඹවීම.

4.7 පිළිගත් ආයතන සහ වෘත්තීය මට්ටමේ පර්යේෂකයන් සමඟ අන්තර්පුද්ගල සම්බන්ධතා වර්ධනයට සිසුන්ට අවස්ථා සම්පාදනය කිරීම.

**5.0 සාමාජිකත්වය**

පර්යේෂණ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන 6 ශ්‍රේණියේ සිට 13 වන ශ්‍රේණිය දක්වා ඕනෑ ම ශිෂ්‍යයකුට හෝ ශිෂ්‍යාවකට හෝ මෙහි සාමාජිකත්වය ලබා ගත හැකි ය. පාසල් පර්යේෂණ ශිෂ්‍ය සමාජයට සාමාජිකයන් බඳවා ගැනීමේ ක්‍රමවේදය පාසල් මට්ටමින් තීරණය කළ හැකි ය.

**6.0 කාරක සභාව**

6.1 කාරක සභාව විධායක මණ්ඩලයකින් හා කාරක සභිකයන්ගෙන් සමන්විත වේ.

6.2 අ.පො.ස. (උසස් පෙළ) පන්තිවල ඉගෙනුම ලබන සාමාජිකයන් අතුරින් විධායක මණ්ඩලය තෝරා පත් කර ගත යුතු ය. අ.පො.ස. (උසස් පෙළ) පන්තිවල ප්‍රමාණවත් ශිෂ්‍ය සංඛ්‍යාවක් නොමැති හෝ අ.පො.ස. (උසස් පෙළ) පන්ති ක්‍රියාත්මක නොවන (2 වර්ගයේ) පාසල්වල අ.පො.ස. (සාමාන්‍ය පෙළ) සිසුන්ගෙන් විධායක මණ්ඩලය පත් කර ගත යුතු ය.

6.2 මෙම කාරක සභාවේ ධුර කාලය වර්ෂයකට සීමා වේ. එහෙත් එක් ශිෂ්‍යයෙකුට අඛණ්ඩ ව විධායක මණ්ඩලයේ ඕනෑ ම තනතුරක් දැරිය හැකි උපරිම කාලය වර්ෂ දෙකකි.

**7.0 නිලධාරී මණ්ඩලයේ සංයුතිය**

7.1 පහත 7.2 හි සඳහන් (i) සිට (iii) දක්වා වන තනතුරු පාසලේ විදුහල්පති ඇතුළු ආචාර්ය මණ්ඩලයෙන් ද, iv සිට ix දක්වා වන තනතුරු පාසලේ සිසුන් අතරින් ද පත් කර ගත යුතු ය.

(ඒ සඳහා පර්යේෂණ පිළිබඳ උනන්දුවක් දක්වන සහ හැකියාවක් සහිත සිසු සිසුවියන් අදාළ ගුරුවරුන්ගේ එකඟතාව මත පත් කර ගත යුතු ය).

7.2 භාණ්ඩාගාරිකගේ කාර්යභාරය අධීක්ෂණය සඳහා වාණිජ අංශයේ ගුරුවරයකු හෝ සුදුසු වෙනත් ගුරුවරයකු හෝ සම්බන්ධ කර ගත යුතු ය.

i. ප්‍රධාන අනුශාසක - විදුහල්පති

ii. අනුශාසක - විදුහල්පති විසින් පත් කරන නියෝජ්‍ය හෝ සහකාර හෝ විදුහල්පතිවරයකු

iii. සමාජය භාර ආචාර්ය - පර්යේෂණ පිළිබඳ අත්දැකීම් සහිත උනන්දුවක් දක්වන ගුරුවරුන් සමාජය භාර ගුරුවරුන් ලෙස පත් කර ගත හැකි අතර ඒ අතරින් එක් අයකු සමාජය භාර ප්‍රධාන ආචාර්ය ලෙස පත් කර ගත යුතු ය.

iv. සභාපති

v. උපසභාපති

vi. ලේකම්

vii. උපලේකම්

viii. භාණ්ඩාගාරික

ix. කාරක සභිකයන් - මේ සඳහා එක් ශ්‍රේණියකින් එක් අයකු නියෝජනය වන පරිදි සාමාජිකයන් පත් කරගත යුතු අතර කාරක සභාවේ ඇති වන පුරප්පාඩු පිරවීමේ බලය කාරක සභාව සතු වේ. එම පත්වීම මහ සභාවේ දී පසු ව අනුමත කර ගත යුතු ය.

## 8.0 නිල දරන්නන්ගේ කාර්යභාරය

### 8.1 ප්‍රධාන අනුශාසක

8.1.1 පාසල් පර්යේෂණ ශිෂ්‍ය සමාජයේ කටයුතු සඳහා මඟ පෙන්වීම හා අධීක්ෂණයත්, සමාජය මඟින් සිදු කරනු ලබන පර්යේෂණ සඳහා මූලික අනුමැතිය ලබා දීමත් පාසලේ අභ්‍යන්තර විනය හා ආචාර ධර්ම පද්ධතියට අනුකූල ව එකී ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමත් ප්‍රධාන අනුශාසක ලෙස පාසලේ විදුහල්පති සතු වගකීමක් වේ.

8.1.2 තවද මෙම සමාජයේ ක්‍රියාකාරකම් පාසලේ වාර්ෂික හා මධ්‍යකාලීන සැලසුම්වලට ඇතුළත් කිරීම, ගුරුවරුන් මේ පිළිබඳ ව දැනුම්වත් කිරීම, ගුරු හා සිසුන් ඇගයීමකට ලක් කිරීම පාසලේ විදුහල්පතිගේ කාර්යභාරය වේ.

### 8.2 අනුශාසක

8.2.1 ශිෂ්‍ය සමාජය නිසි පරිදි මෙහෙයවීම අනුශාසකගේ වගකීම වේ.

### 8.3 සමාජය භාර ආචාර්ය

8.3.1 සිසුන් සක්‍රිය ලෙස ශිෂ්‍ය සමාජයේ කටයුතුවලට යොමු කිරීම හා මඟ පෙන්වීම පාසල් පර්යේෂණ ශිෂ්‍ය සමාජය භාර ආචාර්යවරුන්ගේ වගකීම වේ.

8.3.2 පාසල් පර්යේෂණ ශිෂ්‍ය සමාජයේ සාමාජිකයන්ගේ නව යෝජනා ලබා ගැනීම හා අනුමත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ක්‍රියාකාරී ව කටයුතු කිරීම සමාජය භාර ආචාර්යවරුන්ගේ කාර්යභාරය වේ.

**8.4 සභාපති**

8.4.1 පර්යේෂණ ශිෂ්‍ය සමාජයට නායකත්වය දීම,

8.4.2 පර්යේෂණ ශිෂ්‍ය සමාජයේ සියලු කටයුතු සංවිධානය කිරීම හා වගකීම දැරීම,

8.4.3 පර්යේෂණ ශිෂ්‍ය සමාජයේ රැස්වීම් පැවැත්වීමට අදාළ සාමූහික තීරණ ගැනීම,

8.4.4 පර්යේෂණ ශිෂ්‍ය සමාජයේ රැස්වීම්වල මූලසුන හෙබවීම,

8.4.5 පර්යේෂණ ශිෂ්‍ය සමාජය පවත්වාගෙන යාම සම්බන්ධ කාර්ය (ප්‍රධාන තනතුරු සඳහා නියෝජිතයන් පත් කර ගැනීම, නාම යෝජනා කැඳවීම, නාම යෝජනා සම්මත කිරීම, පුහුණු වැඩසටහන් පැවැත්වීම යනාදිය) සිදු කිරීම සහ

8.4.6 පර්යේෂණ ශිෂ්‍ය සමාජයේ වර්ධනය මෙන්ම එහි සාර්ථකත්වය සඳහා දිගුකාලීන ඉලක්ක සහ උපාය මාර්ග සාමූහික ව සකස් කර ක්‍රියාවට නැංවීම සඳහා නායකත්වය ලබාදීම සභාපතිගේ වගකීම වේ.

**8.5 උපසභාපති**

8.5.1 පර්යේෂණ ශිෂ්‍ය සමාජයේ ක්‍රියාකාරකම් හා මෙහෙයුම් සඳහා සභාපතිට සහාය දැක්වීම, සභාපති නොමැති අවස්ථාවල සභාපති තනතුරේ කටයුතු ආවරණය කිරීම උපසභාපතිගේ වගකීම වේ.

**8.6 ලේකම්**

8.6.1 රැස්වීම් කැඳවීමේ වාර්තා සටහන් තබා ගැනීම හා ශිෂ්‍ය සමාජයට අදාළ ලිපි ලේඛන, පොත්පත් යාවත්කාලීන ව පවත්වාගෙන යාම,

8.6.2 සමාජය වෙත ඉදිරිපත් වන යෝජනා සභාගත කිරීම සහ

8.6.3 නව සාමාජිකයින් බඳවා ගැනීම හා දත්ත පාදකය පවත්වාගෙන යාම ලේකම්ගේ කාර්යභාරය වේ.

**8.7 උපලේකම්**

8.7.1 ලේකම්ගේ කටයුතුවලට සහාය දීම සහ ලේකම් නොමැති අවස්ථාවල ලේකම් තනතුරේ කටයුතු ආවරණය කිරීම උපලේකම්ගේ වගකීම වේ.

**8.8 භාණ්ඩාගාරික**

8.8.1 පර්යේෂණ ශිෂ්‍ය සමාජයේ මුදල් සම්බන්ධ සියලු කටයුතු සිදු කිරීම (මෙහි දී අනිවාර්යයයෙන් ම පර්යේෂණ සමාජය භාර ගුරුවරයකුගේ පූර්ණ වගකීම හා මඟපෙන්වීම ලබා ගත යුතු ය).

8.8.2 මුදල් ගනුදෙනු සම්බන්ධ වාර්තා යාවත්කාලීන ව පවත්වා ගෙන යාම භාණ්ඩාගාරිකගේ කාර්යභාරය වේ.

**9.0 රැස්වීම් පැවැත්වීම**

පාසල් පර්යේෂණ ශිෂ්‍ය සමාජයේ රැස්වීම්, කාරක සභා රැස්වීම් හා මහ සභා රැස්වීම් ලෙස කොටස් දෙකකි. කාරක සභා රැස්වීම සෑම තුන් මසකට වරක් පැවැත්විය යුතු අතර මහ සභා රැස්වීම් වර්ෂයකට එක් වරක්වත්

පැවැත්විය යුතු ය. එසේ ම අවශ්‍යතාව මත විවිධ කමිටු රැස්වීම් හෝ විශේෂ මහ සභා රැස්වීම් හෝ කැඳවීම පාසලේ විදුහල්පතිගේ අනුමැතිය යටතේ සිදු කළ හැකි ය.

**9.1 වාර්ෂික මහ සභා රැස්වීම**

වාර්ෂික මහ සභා රැස්වීම සෑම වර්ෂයක ම පළමු වාරය තුළ පැවැත්විය යුතු අතර එහි දී ඉදිරි වසර සඳහා කාරක සභාව පත් කර ගැනීම ද පැවති වර්ෂයේ අයවැය වාර්තාව සභා සම්මත කර ගැනීම ද සිදු කළ යුතු ය.

එසේම මහ සභාවේ යෝජනා සැලකිල්ලට ගෙන ඉදිරි වර්ෂයේ සිදු කිරීමට සැලසුම් කළ සියලු ක්‍රියාකාරකම් / ව්‍යාපෘති ඇතුළත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සභාවට ඉදිරිපත් කර සම්මත කර ගත යුතු ය. මෙම වාර්ෂික මහ සභා රැස්වීමට ප්‍රධාන අනුශාසක / අනුශාසක (දෙදෙනා ම / එක් අයකු) සහාගී විය යුතු ය.

**10.0 උපදේශකත්වය හා මඟ පෙන්වීම**

මෙම පර්යේෂණ සමාජයට අදාළ ව උපදෙස් ලබා දීම, අධීක්ෂණය හා නියාමනය අධ්‍යාපන අමාත්‍යාංශයේ පර්යේෂණ හා සංවර්ධන ශාඛාවේ අධ්‍යාපන අධ්‍යක්ෂ, පළාත් හා කලාප අධ්‍යාපන කාර්යාලවල පර්යේෂණ විෂය භාර නියෝජ්‍ය / සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් / නිලධාරීන් විසින් සිදු කරන අතර ශිෂ්‍ය සමාජයට අදාළ ආසන්නත ම පාර්ශ්ව වශයෙන්) පාසලේ විදුහල්පති සහ පර්යේෂණ ශිෂ්‍ය සමාජය භාර ගුරුවරයා විසින් උපදෙස් ලබා දීමත්, මඟ පෙන්වීමත් සිදු කරනු ඇත. පර්යේෂණ සම්පූර්ණ කරන සිසුන් පාසල් මට්ටමින් ඇගයීමට ලක් කිරීම සිදු කළ හැකි ය.

**11.0 යෝජිත ක්‍රියාකාරකම් හා ඒවා ක්‍රියාත්මක කිරීම**

පර්යේෂණ ශිෂ්‍ය සමාජයේ සාමාජිකයන්ගේ යෝජනා මත පදනම් ව විදුහල්පතිගේ මූලික අනුමැතියට යටත් ව පර්යේෂණවලට අදාළ විවිධ වැඩසටහන් සැලසුම් කළ හැකි ය. විවිධ ක්‍රියාකාරකම් හා ව්‍යාපෘති සඳහා කාරක සභාවේ අභිමතය පරිදි අනුකමිටු පත් කර ගත හැකි ය. ශිෂ්‍ය සමාජයේ අරමුණුවලට අනුකූල ව එසේ සැලසුම් කළ හැකි වැඩසටහන් කිහිපයක් පහත දක්වා ඇත.

11.1 පර්යේෂණවල වැදගත්කම සම්බන්ධයෙන් සමාජයේ සිසුන් දැනුම්වත් කිරීම, සිසුන්ට පර්යේෂණ සිදු කිරීම සඳහා අවස්ථා සම්පාදනය සහ ඒ සඳහා පර්යේෂණ සම්බන්ධ මූලික සංකල්ප හා ආරම්භන ශක්තිය (Initiative Power) සංවර්ධනය කිරීමට වැඩමුළු සංවිධානය කිරීම. ඒ සඳහා පර්යේෂණ විෂය පිළිබඳ සාකච්ඡා කිරීමට පර්යේෂණ විෂය පිළිබඳ දැනුමැති සම්පත් දායකයන් සම්බන්ධ කර ගනිමින් වැඩමුළු හා දේශන පැවැත්වීම.

11.2 ගුරුවරුන්ගේ මඟ පෙන්වීම යටතේ තෝරා ගත් මාතෘකාවලට අදාළ පර්යේෂණ සිදු කිරීම.

11.3 පර්යේෂණ සිදු කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම.

11.4 පර්යේෂණ අනාවරණ ප්‍රකාශයට පත් කිරීම සඳහා පාසල තුළ විශේෂ පර්යේෂණ සම්මන්ත්‍රණ සංවිධානය කිරීම හා එම පර්යේෂණ ලිඛිත ව ප්‍රකාශයට පත් කිරීමට අවස්ථාව ලබා දීම.

11.5 පර්යේෂණ ලිපි ඇතුළත් ශාස්ත්‍රීය සඟරාවක් පාසල් මට්ටමින් වාර්ෂික ව එළි දැක්වීම.

11.6 පර්යේෂණවලට අදාළ ක්ෂේත්‍ර අධ්‍යයන සංවිධානය කිරීම.

11.7 ජාතික හා ජාත්‍යන්තර ආයතන මඟින් සංවිධානය කරනු ලබන පර්යේෂණ වැඩසටහන්, ව්‍යාපෘති හා සම්මන්ත්‍රණ ආදිය සඳහා සම්බන්ධ වීම.

11.8 අධ්‍යාපන අමාත්‍යාංශයේ පර්යේෂණ හා සංවර්ධන ශාඛාව මඟින් වාර්ෂික ව පවත්වනු ලබන 'පාසල් පර්යේෂණ සතිය' ක්‍රියාත්මක කිරීම.

**12.0** පාසල් පර්යේෂණ ශිෂ්‍ය සමාජයේ මූල්‍ය පරිපාලන කටයුතු පාසල් සංවර්ධන සමිති ගිණුම හරහා හා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් මේ සම්බන්ධයෙන් නිකුත් කරනු ලබන චක්‍රලේඛ හා උපදෙස්වලට අනුකූල ව සිදු කළ යුතු ය. මෙම චක්‍රලේඛයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පිටපත් අතර වෙනසක් පවතින්නේ නම් සිංහල පිටපත නිවැරදි සේ සලකා කටයුතු කළ යුතු ය.

**13.0** පාසල් පර්යේෂණ ශිෂ්‍ය සමාජ ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් නිකුත් කරන මෙම චක්‍රලේඛය මනා ව අධ්‍යයනය කර, 6 ශ්‍රේණියේ සිට ඉහළට පන්ති පැවැත්වෙන පාසල්වල වඩාත් විධිමත් ව පර්යේෂණ ශිෂ්‍ය සමාජ ස්ථාපිත කිරීමට කටයුතු කරන ලෙස ද, අනාගත ලෝකයට වැඩදායී ප්‍රායෝගික හා ගවේෂණශීලී කුසලතා සහිත දක්ෂ ශිෂ්‍ය පරම්පරාවක් බිහි කිරීමට මහ පාදන විෂය සමගාමී ක්‍රියාකාරකමක් ලෙස සලකා පාසල් පර්යේෂණ ශිෂ්‍ය සමාජ සක්‍රීය ලෙස පවත්වා ගෙන යන ලෙස ද දන්වා සිටිමි.

එම්. එන්. රණසිංහ
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත් :

1. විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය
2. සියලු ම පළාත් ප්‍රධාන ලේකම්වරුන්
3. සියලු ම අතිරේක ලේකම්වරුන්, අධ්‍යාපන අමාත්‍යාංශය
4. අධ්‍යක්ෂ ජනරාල් (ගිණුම් හා මූල්‍ය), අධ්‍යාපන අමාත්‍යාංශය
5. ප්‍රධාන අභ්‍යන්තර විගණක, අධ්‍යාපන අමාත්‍යාංශය
6. ප්‍රධාන මූල්‍ය නිලධාරී, අධ්‍යාපන අමාත්‍යාංශය
7. සියලු අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්, අධ්‍යාපන අමාත්‍යාංශය
8. අධ්‍යක්ෂ, ජාතික මෙහෙයුම් මැදිරිය, අධ්‍යාපන අමාත්‍යාංශය
9. සියලු ම පළාත් / කලාප පර්යේෂණ විෂය භාර නියෝජ්‍ය / සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්